# ශ්‍රී ලංකාවේ සමාජ ඒකාබද්ධතාව ඇතිකිරීම සඳහා පුරවැසි අධ්‍යාපන විෂය හඳුන්වාදීම

ආචාර්ය ලක්ෂ්මන් වෙඩික්කාරගේ[1], කේ. ඒ. එන්. පුෂ්පකුමාර[2]

**සංක්ෂිප්තය**

ශ්‍රී ලංකාව තුළ සිංහල, දෙමළ, මුස්ලිම් හා බර්ගර් යන ජන වාර්ගික කණ්ඩායම් ද බෞද්ධ, හින්දු, ඉස්ලාම්, කතෝලික, ක්‍රිස්තියානි වැනි ආගම් අදහනු ලබන ආගමික කණ්ඩායම් ද, සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා කතා කරනු ලබන ජන කොටස් ද ජීවත් වෙති. එම නිසා ශ්‍රී ලංකාව බහු සංස්කෘතික රටක් ලෙස හඳුන්වනු ලැබේ. බහු සංස්කෘතික රටක වාර්ගික, ආගමික සහ භාෂාමය වෙනස්කම් සහිත කණ්ඩායම් සාධක එකක් හෝ කිහිපයක් පදනම් කර ගෙන ගැටුම් ඇති කර ගැනීම සුලභ ලක්ෂණයකි. එම නිසා බහු සංස්කෘතික රටවල සමාජ ඒකාබද්ධතාව (Social Cohesion) ඇති කිරීම අත්‍යවශ්‍ය වේ. සමාජ ඒකාබද්ධතාව ඇති කිරීම සඳහා විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කළ හැකි වුවද අධ්‍යාපනය මගින් ඒ සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම එහි ප්‍රමුඛ වගකීමකි. වාර්ගිකත්වය පදනම් කර ගනිමින් වසර 30කට අධික කාලයක් පැවති යුදමය තත්ත්වය හේතු කොට ගෙන ශ්‍රී ලංකාවේ සමාජ ඒකාබද්ධතාවය දරුණු බිඳ වැටීමකට ලක්ව ඇත. ලාංකේය සමාජය තුළ පවතින බෙදීම්නැති කොට සමාජ ඒකාබද්ධතාව ඇති කිරීම කාලීන අවශ්‍යතාවක් ද වේ. අතීතයේ දී කවර ක්‍රියාමාර්ග ගනු ලැබුව ද වර්තමානයේ අධ්‍යාපනය තුළින් සමාජ ඒකාබද්ධතාව ඇති කිරීම කෙරෙහි ඍජු අවධානය යොමුව පවතින්නේ එබැවිනි. එහි ප්‍රතිඵලයක් ලෙස පුරවැසි අධ්‍යාපනය විෂය 2007 නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනා හරහා හඳුන්වා දෙනු ලැබීය. 6-9 දක්වා ශ්‍රේණි සඳහා අනිවාර්ය විෂයයක් ලෙසත්, 10-11 ශ්‍රේණි සඳහා කාණ්ඩ විෂයයක් ලෙසත් පුරවැසි අධ්‍යාපනය විෂය පාසල් පද්ධතිය තුළ ක්‍රියාත්මක කරන ලද නමුත් විෂය හඳුන්වාදීමේ අරමුණු කොතෙක් එමගින් ඉටුව පවතීද යන්න පිළිබඳ විධිමත් අධ්‍යයනයක් මෙතෙක් සිදුව නොමැත. එම නිසා සමාජ ඒකාබද්ධතාව ඇති කිරීම සඳහා 6-9 ශ්‍රේණිවල ක්‍රියාත්මක පුරවැසි අධ්‍යාපනය විෂය දක්වන දායකත්වය කෙබඳු ද යන්න මූලික අරමුණු හතරක් හා පර්යේෂණ ප්‍රශ්න හතරක් ඔස්සේ ගුණාත්මක පර්යේෂණ ප්‍රවේශය භාවිතයට ගනිමින් අධ්‍යයනයට ලක් කිරීම මෙම පර්යේෂණය මගින් සිදු කරනු ලදි. ඉන් අනාවරණය වූයේ විෂය අරමුණු හා සමපාත වෙමින් ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ, ඉගෙනුම් ආධාරක සහ ඉගෙනුම් උපකරණ සම්පාදනය කරනු ලැබුව ද පෙළ පොත් රචනා කිරීම, ගුරු පුහුණු


[1] ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, අධ්‍යාපන සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, අධ්‍යාපන පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය

[2] අධ්‍යාපන දර්ශනශූරී පර්යේෂක, අධ්‍යාපන පීඨය, කොළඹ විශ්වවිශ්ව විද්‍යාලය

අවශ්‍යතා හා සම්පත් පුද්ගල දායකත්වය සැපයීම, පාසල් පද්ධතිය තුළ විෂයය ඉගැන්වීම යන අවස්ථා තුළින් එකී අරමුණ සාධනය ගිලිහී ගොස් ඇති බවයි.

**හැඳින්වීම**

සමාජ ක්‍රමයක් තුළ සියලු සාමාජිකයින් පොදු නීතිරීතිවලට ගරු කරමින් හා එකිනෙකාට ගරුකරමින් වෙනස්කම් දරා ගැනීම සමාජ ඒකාබද්ධතාව ලෙස ජෙන්සන් (Jensen,1998) හඳුන්වා දෙනු ලබයි. එසේම පොදු අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වෙනස්කම් සහිත කණ්ඩායම් තම වෙනස්කම් පිටු දැකීම සමාජ ඒකාබද්ධතාව ලෙස ආර්ථික සහයෝගීතාව හා සංවර්ධනය පිළිබඳ සංවිධානය (OECD,2001) පෙන්වා දෙයි. තවද සමාජය තුළ ජීවත්වන සියලු සාමාජිකයන්ට සමාන ඉඩ ප්‍රස්තා ඇති කිරීමට සූදානම් වීම හා ඒ කෙරෙහි කැපවීමත්, සහයෝගයෙන් යුතුව ඒ සඳහා සහය දැක්වීමත් තුළින් සමාජ ක්‍රමය තුළ සමානාත්මතාව තහවුරු කිරීම සමාජ ඒකාබද්ධතාව වන බව රිට්සන් (Ritzen,2001) විස්තර කරයි. ඒ අනුව සමාජ ඒකාබද්ධතාව යන්නෙන් අදහස් කරනු ලබන්නේ සමාජ ක්‍රමයක් තුළ ජීවත් වන සියලු සාමාජිකයින් පොදු නීතිරීතිවලට ගරු කරමින් වෙනස්කම් දරා ගැනීමත්, එකිනෙකාට ගරු කරමින් කටයුතු කිරීමත් ලෙස අර්ථ දැක්විය හැකිය. සමාජ ඒකාබද්ධතාව ප්‍රධාන මාන පහකින් සමන්විත වන බව ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය තුළින් සමාජ ඒකාබද්ධතාව ප්‍රවර්ධනය කිරීම පිළිබඳ වාර්තාව පෙන්වා දෙයි. (The Promotion of Social Cohesion through Education in Sri Lanka, 2011).




මූලාශ්‍රය: The Promotion of Social Cohesion through Education in Sri Lanka, 2011

එම වාර්තාව වැඩිදුරටත් පෙන්වා දෙන්නේ සමාජ ඒකාබද්ධතාව ඇති කිරීම සඳහා අධ්‍යාපනය මගින් සිදු කළ හැකි කාර්යභාරය ප්‍රධාන මානයන් විෂය මාලාව, (Curriculum) ගුරු අධ්‍යාපනය, (Teacher Education) දෙවන භාෂාව ඉගැන්වීම ප්‍රවර්ධනය කිරීම, (Second National Language) සමස්ත පාසල් සංස්කෘතිය වැඩි දියුණු කිරීම, (Whole School Culture) පාසල් අන්තර්කරණය, (Intergrated School) විෂය සමගාමී ක්‍රියාකාරකම් ඇති කිරීම, (Co - Curricular activities) සහ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම (Research) එම මානයන් වේ.

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව 2003 වර්ෂයේ ප්‍රකාශයට පත් කළ " මානව සංවර්ධනය සඳහා අධ්‍යාපනයේ ඉදිරි දැක්මඃ ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති රාමුවක් සඳහා යෝජනා" (2003) මගින් පුරවැසි අධ්‍යාපනය විෂය පාසල් පද්ධතියට හඳුන්වාදීමේ අවශ්‍යතාව පෙන්වා දී ඇත. ඒ අනුව 2005 වර්ෂයේ සිට ඉතිහාසය හා සමාජ අධ්‍යයනය විෂයය වෙනුවට 6-11 ශ්‍රේණි සඳහා පුරවැසි අධ්‍යාපනය, භූගෝල විද්‍යාව හා ඉතිහාසය යන විෂයයන් හඳුන්වා දෙනු ලැබීය. 6 ශ්‍රේණියේ පරිසර අධ්‍යයනය, 6-11 ශ්‍රේණිවල සමාජ අධ්‍යයනය හා ඉතිහාසය විෂයය ඉවත් කර ඉතිහාසය, භූගෝල විද්‍යාව, ප්‍රජාචාරය/පුරවැසි අධ්‍යාපනය වශයෙන් අනිවාර්යය විෂයයන් තුනක් 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා ක්‍රියාත්මක කිරීමට ද එමගින් නිර්දේශ කරනු ලැබීය.

ශ්‍රී ලංකාවේ පාසල් විෂයමාලාවට පුරවැසි අධ්‍යාපනය විෂය හඳුන්වාදීමේ මූලික අරමුණ සමාජ ඒකාබද්ධතාව ඇති කිරීම බව තහවුරු වේ. එම පරමාර්ථය පෙරදැරි කර ගෙන 2007 වර්ෂයේ සිට සිදු කළ විෂයමාලා ප්‍රතිසංස්කරණය යටතේ තනි විෂයක් ලෙස පැවති ජීවන නිපුණතාව (Life Skills) යන විෂය පුරවැසි අධ්‍යාපනය විෂයට ඒකාබද්ධ කරනු ලැබීය. එහි ප්‍රතිඵලයක් ලෙස 6-9 ශ්‍රේණි සඳහා ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය ලෙස විෂයේ නම සංශෝධනය වූ අතර ගුරු මාර්ගෝපදේශයෙහි විෂයය දෙකට අදාළ විෂය සන්ධාර දෙකක් සහ පෙළ පොතෙහි කොටස් දෙකක් ද වශයෙන් වෙන්ව පැවතුණි. (පුරවැසි අධ්‍යාපනය ගුරු මාර්ගෝපදේශය, 6 ශ්‍රේණිය, (2014) 10-11 ශ්‍රේණි සඳහා පුරවැසි අධ්‍යාපනය හා ප්‍රජා පාලනය නමින් විෂයයේ නම වෙනස් කරනු ලැබීය.

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව (2003) විසින් සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලීන් තුළ දැකිය හැකි දූර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟා කර ගත යුතු අරමුණු අටක් ජාතික අධ්‍යාපන අරමුණු (National Education Goals) ලෙස හඳුන්වා දෙනු ලැබීය. එම අරමුණු අතුරින් සමාජ ඒකාබද්ධතාව ඇති කිරීම සඳහා ඍජුව දායක වන අරමුණු දෙකක් හඳුනා ගත හැකිය.තවදුරටත් කරුණු අනාවරණය කරන

ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව (2003) ජාතික අධ්‍යාපන අරමුණු සාධනය කර ගැනීම සඳහා සපුරාලිය යුතු මූලික නිපුණතා හතක් පෙන්වා දෙනු ලබයි. එහි පරිසරයට අදාළ නිපුණතාව යටතේ අනු නිපුණතා අටක් වන අතර සමාජ ඒකාබද්ධතාව ඇති කිරීම සඳහා ඒවා පාදක වන බව සැලකිය හැකිය.අබේවික්‍රම (2010) පෙන්වා දෙන පරිදි බහුවිධ සමාජ ක්‍රමයක් තුළ ප්‍රජාචාර අධ්‍යාපනය හෙවත් පුරවැසි අධ්‍යාපනය තුළින් සිදු කරනුයේ විශාල මෙහෙයකි. එතුළින් ඉටු කර ගැනීමට අපේක්ෂිත අත්‍යවශය අංග තුනක් පිළිබඳව ඔහු අවධාරණය කරනු ලබයි.

1. පුරවැසි දැනුම (Civic knowledge)
2. පුරවැසි ආකල්ප (Civic attitudes / Civic disposition)
3. පුරවැසි කුසලතා (Civic skills)

6 ශ්‍රේණිය ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය (2007) ගුරු මාර්ගෝපදේශයට අනුව ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය විෂය කොටස් දෙකෙහි අරමුණු වෙන් වශයෙන් දක්වා ඇත. එහි පුරවැසි අධ්‍යාපනයට අදාළ අරමුණු 9 ක් වන අතර ජීවන නිපුණතාව සඳහා අරමුණු 13 කි. ඒ අනුව පුරවැසි අධ්‍යාපනයට අදාළ විෂය අරමුණු සෘජුවම සමාජ ඒකාබද්ධතාව ඇති කිරීම සඳහා දායක වන බව පෙන්වා දිය හැකිය.සමාජ ඒකාබද්ධතාව ඇති කිරීම තුළින් නිර්මාණය කිරීමට අපේක්ෂිත අනාගත පුරවැසියා සතු ගුණාංග 13 ක් "ජාතික ප්‍රතිපත්තිය සහ ක්‍රියාකාරකම් පිළිබඳ විස්තරාත්මක රාමුව" (2008) මගින් පෙන්වා දෙනු ලබයි. එම වාර්තාවට අනුව පුරවැසියකු විසින් කවරාකාරයකින් බහු සංස්කෘතික සමාජයක ජීවත් විය යුතුද යන්න පිළිබඳ මනාව විග්‍රහ කර ඇත.ප්‍රජාචාර විෂය අන්තර්ගතයේ හා ක්‍රියාකාරකම්වල ඇතුළත් විය යුතු ලක්ෂණ කිහිපයක් ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව (2003) විසින් පෙන්වා දෙයි. අන් අය සමග සහයෝගයෙන් ජීවත්වීමට ඉගෙන ගැනීම තුළින් සමාජ ඒකාබද්ධතාව සඳහා විවිධ වාර්ගික, බහු ආගමික, බහු සංස්කෘතික සමාජයක සංස්කෘතික විවිධත්වයට ගරු කිරීම ආදිය එකී විෂය අන්තර්ගතයට ඇතුළත් විය යුතු බව එමඟින් අවධාරණය කරයි.

**පර්යේෂණ ක්‍රමවේදය**

ගුණාත්මක පර්යේෂණ ප්‍රවේශය යටතේ සංකේත අන්තර් ක්‍රියාවාදය පදනම් කොට ගෙන "සන්ධාර විශ්ලේෂණය", පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් භාවිත කරනු ලැබීය. සන්ධාර විශ්ලේෂණය සිදු කිරීමේ දී මේරින්ග් (1983) පෙන්වා දෙන ලද "සාරාංශ කිරීමේ සන්ධාර විශ්ලේෂණය" යොදා ගනු ලැබීය.

**දත්ත විශ්ලේෂණය, නිගමන හා යෝජනා**

දත්ත රැස් කිරීමේ ප්‍රධාන උපකරණ තුනක් මෙම පර්යේෂණයේ දී භාවිතයට ගනු ලැබීය. එනම්, ලිඛිත මූලාශ්‍ර ,සම්මුඛ සාකච්ඡා සහ සහභාගිත්ව නිරීක්ෂණයයි.

ලිඛිත මූලාශ්‍ර ලෙස භාවිතයට ගනු ලැබූවේ 6-9 ශ්‍රේණිවල ක්‍රියාත්මක වන ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය විෂයට අදාළ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ (TGs), පෙළ පොත් (TBs), සිසු අභ්‍යාස පොත් (SEBs)සහ ගුරුවරුන්ගේ දින සටහන් (TDP)වේ.

සම්මුඛ සාකච්ඡාව සඳහා 100 දෙනෙකුගෙන් පමණ සමන්විත නියැදියක් යොදා ගනු ලැබූ අතර එම නියැදිය අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා ක්‍රියාවලියකට බඳුන් කරනු ලැබීය. එමගින් ලබා ගත් තොරතුරුමත පදනම්ව නිගමන හා යෝජනා ඉදිරිපත් කරනු ලැබීය.

තවද, පර්යේෂකයා විසින් සෑබෑ ලෙසම පර්යේෂණ භූමිය තුළ සිදු කරන ලද සහභාගිත්ව නිරීක්ෂණය තුළින් ලබා ගත් දත්තමත පදනම්ව නිගමන හා යෝජනා ඉදිරිපත් කිරීමට පෙළඹුණි.

සම්මුඛ සාකච්ඡා නියැදියට අනුව සිදු කරන ලද දත්ත විශ්ලේෂණය අනුව සිසුන් 25 දෙනා අතුරින් ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් ක්‍රියාවලියකට බඳුන් වී ඇත්තේ දෙදෙනෙකු පමණි. එය සමස්ත ශිෂ්‍ය ජනගහනයෙන් 8%කි.සම්මුඛ සාකච්ඡාව සඳහා බඳුන් කරන ලද ගුරුවරුන් 20 දෙනා අතුරින් පුරවැසි අධ්‍යාපනය විෂය සම්බන්ධයෙන් විධිමත් පුහුණුවක් ලබා තිබුණේ එක් ගුරුවරියක පමණි. එය සමස්ත නියැදියෙන් ප්‍රතිශතයක් ලෙස ගත් විට 5% කි. ඊට අමතරව විෂය උගන්වනු ලබන ගුරුවරුන් අතුරින් පුරවැසි අධ්‍යාපනය විෂයට අදාළ විෂයයක් තම උපාධිය සඳහා හදාරා තිබූ ප්‍රමාණය 8 කි. එය සමස්ත ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස ගත් විට 40% කි.

ඒ අනුව පර්යේෂකයා විසින් සිදු කරන ලද සන්ධාර විශ්ලේෂණයට අනුව පුරවැසි අධ්‍යාපනය විෂය ඉගැන්වීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් විෂය දැනුමක් සහිත ගුරුවරුන්ගේ හිඟකම ප්‍රබල ගැටලුවක් බව හඳුනා ගත හැකි විය. එහිදී කලා විෂයයන් හදාරනු ලැබූ ගුරුවරුන් බහුතරයක් පුරවැසි අධ්‍යාපනය විෂය ඉගැන්වීම සිදු කළ ද, දේශපාලන විද්‍යාව, සමාජ විද්‍යාව, ආර්ථික විද්‍යාව වැනි විෂයයන් තම උපාධියට හදාරා නොතිබුණ බව අනාවරණය විය. එවැනි පසුබිමක් තුළ දේශපාලන විද්‍යාව, සමාජ විද්‍යාව, ආර්ථික විද්‍යාව වැනි විෂය කරුණු සම්බන්ධ

මාතෘකා ගුරුවරයා හට තේරුම් ගැනීමට මෙන්ම සාර්ථකව ඉගැන්වීමට හැකියාවක් නොවන බව අනාවරණය විය. එපමණක් ද නොව එවැනි අවම මූලික සුදුසුකම් හෝ සපුරාලනු නොලැබූ ගුරුවරුන් වෙත කාල සටහන් ලබා දීමට විදුහල්පතිවරු කාරුණික වීම නිසාම ක්‍රියාකාරම් පාදක ඉගෙනුම් ඉගැන්වීම් ශිල්ප ක්‍රම ගිලිහී යන බව අනාවරණය විය. ඒ පිළිබඳව සහභාගිත්ව නිරීක්ෂණය ඇසුරින්ද තහවුරු විය. ඊට අමතරව අවම වශයෙන් වසරකට තුන්වරක් හෝ අවම වශයෙන් එක් වාරයකට එක් සේවාස්ථ සැසියක් වන පරිදි මෙම ගුරුවරුන් විධිමත් පුහුණුවකට ලක් කර නොමැති බව ද අනාවරණය විය. විෂය නිර්දේශය අලුත් වීමෙන් අනතුරුව සිදු කරන පුහුණු සැසි සඳහා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් කැඳවීම් සිදු කර ඇත්තේ 50 දෙනෙකු වැනි පිරිසකට බව ගුරුවරුන් චෝදනා ස්වරූපයෙන් පැවසූහ.

පාසල්වල අතිරික්ත ගුරුවරුන් එම පාසලේම රඳවා ගැනීමේ උපක්‍රමයක් ලෙස බොහෝ විදුහල්පතිවරුන් ප්‍රකාශ කළේ "පුරවැසි අධ්‍යාපනය වැනි විෂයකට අදාළ කාලසටහන් ඔවුන් වෙත ලබා දෙන" බවයි. එමෙන්ම කාල සටහනක් ලබා දිය නොහැකි ගුරුවරුන්ද පුරවැසි අධ්‍යාපනය විෂය ඉගැන්වීමට වඩා සුදුස්සන් වූහ.ගුරු උපදේශකවරුන් පත් කිරීමේ දී ඔවුන් පුරවැසි අධ්‍යාපනය විෂය ඉලක්ක කර ගනිමින් නොව සමාජ විද්‍යා විෂය ධාරාව සඳහා පත් කිරීම තුළ සමස්ත විෂය නිර්දේශය පිළිබඳව ප්‍රමාණවත් අවබෝධයක් හෝ දැනුමක් ඔවුන් සතු නොවීය. වසරක් තුළ පත්වනු ලබන සේවාස්ථ සැසි එකක් හෝ දෙකක් තුළින් සමස්ත විෂය නිර්දේශය හා ඊට අදාළ ක්‍රියාකාරකම් පිළිබඳ අවබෝධයක් ලබා දීම අපහසු කාර්යයක් බව ඔවුන්ගේ මතය විය. තවද සම්පත් පුද්ගල හිඟකම හේතුවෙන් විෂය පිළිබඳ පුළුල් අත්දැකීම් ගුරුවරුන්ට ලබා දිය නොහැකි බවද අනාවරණය විය. ඊට මූල්‍ය චක්‍රලේඛ ආදිය සෘජුව බලපාන බව විෂය අධ්‍යක්ෂවරුන්ගේ අදහසයි.

මෙවැනි පසුබිමක් තුළ ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව මගින් හඳුන්වා දෙන ලද සමාජ ඒකාබද්ධතාව ඇති කිරීමට දායක වන අරමුණු සපුරා ගත නොහැකි බවත්, ඒ යටතේ හඳුන්වා දෙන ලද පුරවැසි අධ්‍යාපනය විෂය මඟින් එකී අරමුණු නොසැපිරෙන බවත් පර්යේෂණය තුළින් තහවුරු විය.

ප්‍රමුඛ පද : බහු සංස්කෘතිය, සමාජ ඒකාබද්ධතාව, වාර්ගිකත්වය

ආශ්‍රිත ග්‍රන්ථ

Wijethunga, S. (2007).*National Level Attitude Survey on Social Cohesion*.NEREC, Faculty of Education.University of Colombo.

Organization for Economic Co- operation and Development. (2001). *The well-being of nations: the role of human and social capital*. Center for Educational research and innovation, Paris, France.

Heyneman, S.P.. (2010).*Social Cohesion and Education background: Social Cohesion and development*, Social Function of Education.

Jensen, J. (1998).*Mapping social cohesion: The state of Canadian research*.Canadian policy research network study.

Ritzen, J. (2001). "*Social cohesion,Public policy & economic growth: Implication for OECD countries*" in J.F.Helliwell. (ed.).*The Contribution of human &social capital sustained economic growth and wellbeing*: International symposium report, Human resources development Canada and OECD.